මාධ්‍ය නිවේදන අංක 20

මැතිවරණ කොමිෂන් සභාව

## මාධ්‍ය නිවේදනය

- සුදුසුකම් ලත් පුරවැසියන්ට 2021 වර්ෂයේ වාර්ෂික ඡන්දහිමි නාමලේඛනයේ මාර්ගගතව ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමේ වැඩසටහනක් (Online Registration Programme) මැතිවරණ කොමිෂන් සභාව විසින් සකස් කොට ඇති අතර එම වැඩසටහන 2021 අගොස්තු 03 දින සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- පුරවැසියන්ගේ සාමාන්‍ය පදිංචිය වෙනස් වීම, වයස අවුරුදු 18 සම්පූර්ණ වන තැනැත්තන්ගේ නව ලියාපදිංචිය සහ ප්‍රවර්ථන ඡන්ද හිමි නාමලේඛනයේ පවත්නා ස්වකීය නමෙහි යම් අඩුපාඩුවක් හෝ මුද්‍රණ දෝෂ නිවැරදි කර ගැනීම මෙම නව මාර්ගගත ලියාපදිංචි ක්‍රමය ඔස්සේ සිදු කර ගත හැකි බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

- මෙම නව මාර්ගගත ලියාපදිංචියට අදාළ තොරතුරු හා එයට පිවිසීමේ ක්‍රමවේදය මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වූ https://www.elections.gov.lk යන වෙබ් අඩවියේ මුල් පිටුවේ පැහැදිලිව දක්වා තිබෙන ''මාර්ගගත ලියාපදිංචිය'' මගින් ලබා ගත හැකිය.

- මෙම ක්‍රමවේදය මගින් සිදුකරනු ලබන ඉල්ලීම් ද 1980 ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ සඳහන් විධිවිධාන අනුව ඡන්දහිමියෙකු වශයෙන් ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන ලිපිනයෙහි 2021 වර්ෂයේ දී ලියාපදිංචි කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව කටයුතු කරනු ලබයි.

- රට තුළ පවත්නා වසංගත තත්ත්වය පාලනය පිණිස සංචරණ සීමා පනවා ඇති හෙයින් ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා පවතින බාධා හා අනවශ්‍ය ප්‍රමාදවීම් වළක්වා ගැනීම් වස් මෙම නව ක්‍රමවේදය භාවිතයට ගන්නා ලෙස මැතිවරණ කොමිෂන් සභාව ජනතාවගෙන් ඉල්ලා සිටී.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

2021.08.03

# මාර්ගගත ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම හා ඡන්දහිමි නාමලේඛණය යාවත් කාලීන කිරීම

පියවර **01**

https://eservices.elections.gov.lk/ යන වෙබ් ලිපිනය මගින් සෘජුවම හෝ මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන https://elections.gov.lk/ වෙබ් අඩවිය හරහා මැතිවරණ කොමිෂන් සභාවේ ඊ සේවා ද්වාරය වෙත පිවිසෙන්න.

පියවර **02**

මාර්ගගතව ඡන්දහිමියකු ලෙස ලියාපදිංචි වීමට, පදිංචිය මාරු කිරීමට හෝ ඡන්දහිමි නාමලේඛණයේ තොරතුරු වල දෝෂ නිරාකරණය සිදු කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ඊ සේවා ගිණුමක් සකස් කර ගත යුතුය. මේ වනවිටත් එය සකසා ගෙන තිබේ නම් එය භාවිතා කල හැකිය. එසේ නොමැති නම් Sign Up හරහා පිවිසී පරිශීලක ගිණුමක් සකසා ගන්න.




පියවර **03**

මාර්ගගතව ඡන්දහිමියකු ලෙස ලියාපදිංචි වීමට, පදිංචිය මාරු කිරීමට හෝ ඡන්දහිමි නාමලේඛණයේ තොරතුරු වල දෝෂ නිරාකරණය සඳහා **For Citizens** යටතේ ඇති **Online Registration** වෙත පිවිසෙන්න.



පියවර 04

ගිණුමට පිවිසී අවශ්‍යය තොරතුරු ඇතුලත් කර මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කරන්න. මෙම තොරතුරු සම්පූර්ණ කල යුත්තේ ඔබ තෝරාගෙන ඇති පරිදි සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් පමණි.

ඉතා වැදගත්

**තොරතුරු සම්පූර්ණ කිරීමේදී**

ඔබේ නම ජාතික හැඳුනුම්පතේ දැක්වෙන පරිදි සම්පූර්ණයෙන්ම ඇතුලත් කල යුතුය. නම ඇතුලත් කල යුත්තේ සිංහල අකුරිනි ( දෙමළ භාෂාව තෝරාගෙන ඇත්නම් දෙමළ අකුරිනි).

පියවර 04

දක්වා ඇති උපදෙස් අනුව නිවැරදිවම අයදුම්පත සම්පූර්ණ කර යොමු කරන්න. යොමුකල පසු ඔබගේ ජංගම දුරකතනයට ලැබෙන යොමු අංකය සුරුකිව තබා ගන්න. අයදුම්පත යොමුකල පසු එහි මෘදු පිටපත බාගත කර ඔබ සන්තකයේ තබා ගැනීම වඩා සුදුසුය.

**මෙම පියවර පිළිබඳ යම් අපහැදිලිතාවයක් පවතී නම්**
**මාර්ගගත ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම හා ඡන්දහිමි නාමලේඛනය යාවත් කාලීන කිරීම මාර්ගෝපදේශණ සංග්‍රහය පරිශීලනය කරන්න.**

**මේ පිළිබඳව ඔබට යම් ගැටළුවක් පවතී නම් eservices@elections.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ලියා එවිය හැකිය.**


© මැතිවරණ කොමිෂන් සභාව - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය